"සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ කටයුතු වලදී ඇතිවන සමාජ ගැටළු (දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්)"


ලක්මි ඉමාෂා ගොඩකන්ද
සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
නුගේගොඩ.



Libary - USJP
203081


ශාස්ත්‍රපති 2012


203081

සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ කටයුතු වලදී ඇතිවන සමාජ ගැටළු පිළිබඳ දෙවුන්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින් සිදු කරනු ලබන අධ්‍යයනය.

ලක්මි ඉමාෂා ගොඩකන්ද

## සංක්ෂිප්තය.

සමාජය යනු සංකීර්ණ සම්බන්ධතා ජාලයකින් සමන්විත වූවකි. මෙම සම්බන්ධතා ජාලය ඔස්සේ පුද්ගලයින් වෙනස් වෙමින් ඉදිරියට ගමන් කරයි. සාමාන්‍යයෙන් පුද්ගලයාට සම්බන්ධතා වලින් වියුක්තව ජීවත්විය නොහැක. සමාජය මෙන්ම පුද්ගලයා ද නිරන්තර වෙනස්වීමට ලක්වේ. හෙරක්ලීටස් නම් දාර්ශනිකයා පවසන පරිදි පුද්ගලයාට එකම ගඟට දෙවරක් නොබැසී. එයින් අදහස් කරනු ලැබුවේ ගඟ සහ පුද්ගලයා යන පාර්ශවයන් දෙකම නිරන්තර වෙනස්වීමට ලක්වන බවයි. මෙවැනි සංකීර්ණ සම්බන්ධතා වලින් යුත් සමාජයක ජීවත් වන මිනිසුන් විවිධ හේතු සාදක මත ගැටළු සහගත අවස්ථාවන්ට මුහුණදේ.

මිනිසා විසින් ඇති කරනු ලබන විවිධ ගැටුම් හේතුවෙන් සහ ස්වභාවිකව සිදුවන හානි හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වේ. සෑම රටකටම පොදු තත්ත්වයක් වන මෙය මගින් වර්තමානය වන විට ලෝකය පුරා අවතැන්වීමට ලක්වූ ජනතාව මිලියන 43.7ක් ලෙස වාර්තාවේ. වාර්ගික හා යුද ගැටුම් හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වීමේදී එය දීර්ඝ කාලීන වශයෙන් පුද්ගලයාට බලපානු ලබන අතර සුළිසුළං, ගංවතුර,නායයෑම්,සුනාමි වැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් පුද්ගලයින් අවතැන්වීමට ලක්වුවද පෙර තත්ත්වය මෙන් දීර්ඝකාලීන නොවේ.

මෙවැනි ස්වභාවික ව්‍යසන හේතුවෙන් අවතැන් වන පුද්ගලයින් නැවත නඟා සිටුවීම සඳහා විවිධ ආයතන සහ පුද්ගලයින් ක්‍රියාකරනු ලබයි. ව්‍යසනයක ආසන්නතම අවස්ථාවේදී ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් විවිධ වැඩපිළිවෙල සකස් කර

ක්‍රියාත්මක කරන අතර දීර්ඝ කාලීන පියවර යටතේ පුද්ගලයින් යලි පදිංචි කිරීම සඳහා,ඔවුන්ගේ ජීවනෝපාය නගා සිටුවීම වෙනුවෙන් ද කටයුතු කෙරේ.

මෙසේ කිසියම් ව්‍යසනයකින් පසු ජනතාව නැවත පදිංචි කිරීමේදී නොයෙකුත් ගැටළු වලට මුහුණදීම සුලභ කාරණයකි. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය කිසිදා නතර නොවන දෙයක් වන හෙයින් එහිදි මුහුණදීමට සිදුවන ගැටළු තාවකාලික වේයැයි සිතීම දුෂ්කරය. විවිධ ප්‍රදේශ වල ජීවත්වූ විවිධ සංස්කෘතීන්ට අයත් ජනතාවක් එකම භූමිභාගයක පදිංචි කිරීම තුළ විවිධාකාර ගැටළු මතුවිය හැක. ඒ වෙනුවෙන් අවධානය යොමුකර ගැටළු අවම වනසේ ක්‍රියාකිරීම ගතහැකි වඩාත් සුදුසුම පියවර වන්නේය. මෙම පර්යේෂණය මගින් සුනාමි ව්‍යසනය හේතුවෙන් අවතැන්වීමට ලක්වූ ජනතාව යලි පදිංචි කිරීමේදී මුහුණදීමට සිදුවන සමාජ ගැටළු පිළිබඳව අවධානය යොමු කරනු ලබන අතර ඉදිරියේදී එවන් නැවත පදිංචි කිරීම්හිදී මතුවන ගැටළු සහගත අවස්ථාවන් මග හරවා ක්‍රියාකිරීමට මෙය වඩාත් වැදගත්වේ.

ඒ අනුව මෙම පර්යේෂණය මගින් මාතර දිස්ත්‍රික්කය තුළ සුනාමි ව්‍යසනයට ලක්වූ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පදනම් කර ගනිමින් පුද්ගලයින් නැවත පදිංචි කිරීමේදී සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීම,එහිදි මතුවන සමාජ ගැටළු, ආපදා කළමනාකරණය සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරන්නට යෙදුණි. සමස්තයක් වශයෙන් ගත්විට නැවත පදිංචි කිරීම තුළ මතුවන ගැටළු අවම කර ගැනීම වෙනුවෙන් ගතහැකි පියවර හඳුනා ගැනීම මෙහි අරමුණ වේ.

සමාජය, සමාජ සම්බන්ධතා නිරන්තර වෙනස් වීමට ලක්වීම තුළ සමාජ ගැටළු ඉස්මතුවේ. පුද්ගලයින් එක් එක් කාලවකවානු වලදී නොසිතූ පරිදි මුහුණදෙනු ලබන විවිධ සිද්ධිදාමයන් හේතුවෙන් ඇතිවන්නාවූ ගැටළු වලට විසඳුම් සෙවීමත් ඒවා අවම කර ගැනීමට ක්‍රියාකිරීමත් නිරන්තරව සිදුවන්නක් සහ නිරන්තර අවධානයට ලක්කළ යුතු කරුණකි.

## පටුන


01. සුනාමි ව්‍යසනය මගින් සිදුවූ බලපෑම හඳුනා ගැනීම.

01.01 හැඳින්වීම 1 - 10

01.02 අධ්‍යනයේ අරමුණු 11

01.03 අධ්‍යයන ක්ෂේත්‍රය 12 - 13

01.04 පර්යේෂණ මූලාශ්‍රය,ක්‍රමවේදය සහ නියැදිය විස්තර කිරීම 14 - 16

01.05 පර්යේෂණයේ සීමාවන් සහ ගැටළු 17 - 19

02. පුද්ගලයා සහ සමාජය

02.01 සමාජය, සමාජ සම්බන්ධතා සහ සමාජ ගැටළු හඳුනා ගැනීම 20 - 35

02.01.01 ප්‍රාථමික හා ද්විතීක සමාජ සම්බන්ධතා හඳුනා ගැනීම 36

02.01.01.01 ප්‍රාථමික සමාජ සම්බන්ධතා 37 - 40

02.01.01.02 ද්විතීක සමාජ සම්බන්ධතා 41 - 44

02.02 ශ්‍රී ලංකාවේ සමාජ සම්බන්ධතා ගොඩනැගීම හඳුනා ගැනීම. 45 - 51

03. ශ්‍රී ලංකාව තුළ සිදුවූ ආපදා සහ ආපදා කළමනාකරණය

03.01 උපද්‍රව සහ ආපදා හඳුනා ගැනීම 52 - 59

03.02 ආපදා කළමනාකරණය හැඳින්වීම 60 - 68

03.03 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ඉතිහාසය සහ වර්ධනය 69 - 72

03.03.01 2005 වසරට පෙර ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති 73 - 74

03.03.02 ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති 75 - 76

03.03.03 ආපදා කළමනාකරණ නීතිරීති 77 - 79

03.03.04 ආපදා කළමනාකරණ ආයතනික ව්‍යුහය 80 - 85

03.04 ආපදා කළමනාකරණ කාර්‍යයේදී මුහුණදෙන ගැටළු 86 - 87

03.04.01 ආපදා කළමනාකරණයේදී සිදුවිය හැකි අක්‍රමිකතා 88 - 90

**04. නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ආයතනික ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.**

04.01 නැවත පදිංචි කිරීම 91-105

04.01.01 ශ්‍රී ලංකාවේ නැවත පදිංචි කිරීමේ තත්ත්වයන් සහ සුනාමි නැවත පදිංචි කිරීම සඳහා ගනුලැබූ ක්‍රියාමාර්ග 106-117

04.01.02 ලෝකයේ සුනාමි නැවත පදිංචි කිරීමේ තත්ත්වයන් සහ ගෙනඇති ක්‍රියාමාර්ග 118-128

04.02 ආයතනික ක්‍රියාමාර්ග විස්තර කිරීම 129-131

04.02.01 ප්‍රදේශය තෝරා ගැනීම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීම 132-138

**05. සුනාමි ව්‍යසනයෙන් පසු ජනතාව යළි පදිංචි කිරීමේ ගැටළු හඳුනා ගැනීම**

05.01 දත්ත විශ්ලේෂණය 139-160

**06. සමාලෝචනය,නිගමන සහ යෝජනා** 161-173

ඇමිනුම් අංක 01 174-175

ඇමිනුම් අංක 02 176

ඇමිනුම් අංක 03 177-178

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 184-194